# බිය නොවී සටන් වැදූනු සමිතිවලට ආචාරය!

මාධ්‍යවේදීන්ට මේ තරම් කරදර ඇති වුණ කාලයක් තවත් නැති තරම්. මහින්ද රජය මේ තරම් පටලැවිල්ලක් මාධ්‍යකරුවන් සමඟ ඇති කරගත්තේ ඇයි කියල හොයන්න වටිනව.

අද ඔහු සමඟ ගැටෙන පෝද්දල ජයන්ත, සනත් බාලසූරිය වැනි අය රනිල් එදා අගමැතිව හිටි කාලේ රැකියාවෙන් දොට්ට වැටිල ඉතා අමාරු තත්වයන් තුළ වැඩ කරපු අය. මේ හුඟ දෙනෙක් මහින්ද බලයට ගෙන ඒම වෙනුවෙන් ලොකුවට වැඩ කරපු අය.

හැබැයි දැන් නම් මහින්දට මේ වගේ උදවිය බලාපොරොත්තු වන දේවල් දෙන්නට නම් බෑ. මේ වගේ මහින්ද සමඟ ගැටෙන පරණ උදව්කාරයෝ වර්ග දෙකකට බෙදන්න පුළුවන්.

එක් කොටසක් පැහැදිලිවම ජනතා විමුක්ති පෙරමුණේ අයට හිතවත් අයයි. ඒ අය ජවිපෙ පක්ෂයට බැඳුන අයම කියල කියන්න බෑ. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ අදහස්වලට අනුව හිතන පතන අය වෙන්න පුළුවන්.

අනෙක් අතට ජාතිවාදයට යට නුන සාමාන්‍ය ජනතාවාදී නැත්නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී උදවියත් දැන් මහින්ද සමඟ ගැටෙනව. සම සමාජ, කොමියුනිස්ට් පක්ෂවලට හිතවත් අයත් මේ ගොඩට දමන්න පුළුවන්. කවදාවත් හිතන්න බැරි විදියට කොමියුනිස්ට් පක්ෂයේ සුබසිංහ උන්නැහේ ඇතුළු වෘත්තීය සමිති නායකයෝ දැන් මහින්දට ආඩපාළි කියන්න පටන් අරන්.

මාධ්‍ය, කලා ආයතනවල සභාපති ධුරවලට පත් කරල හිටපු මේ ඊනියා වාමගාමීන් උනත් දැන් ටික ටික එළියට වැටෙමින් ඉන්නේ. සුනිල් සරත් පෙරේරා උන්නැහේ විසි වුණේ එයාවත් දන්නේ නැති විදියට.

මේ උදවිය එළියට දමන අතර වාමගාමී වෘත්තීය සමිති නායකයින් තලා දැමීමටත් මහින්දට උවමනා වෙලා තියෙනව. දැන් උන්නැහේට උවමනා වමේ අයගේ උදව්ව නෙවෙයි, රනිල් වික්‍රමසිංහගේ උදව්වයි.

ඒත් වැඩපල මට්ටමේ UNP කාරයෝ හැසිරෙන්නේ JVP කාරයෝ වගේමයි. ඒ නිසා වැඩපලේ යූඇන්පී නායකයින් මහින්දට දැන් අවශ්‍ය නෑ. නිළධාරී පැළැන්තිය තුළ වැජඹෙන යූඇන්පී කාරයින්ගේ පිහිටාධාර නම් එතුමන්ට දැන් ඕනෑ වෙලා තියෙනව.

එනිසා එම වෙට්ටුව දමන්න තමයි දැන් උන්නැහේ සැරසෙන්නේ. තමන්ට දැන් ආධාර උපකාර කරන ගෝලීය බලවතුන් තරහා කරගන්නේ නැතිව උන්ගේ න්‍යාය පත්‍රය අනුව යන ගමනක් ගැනයි මහින්දට ඕනෑ වෙලා තියෙන්නේ. ඒ සඳහා යන ගමනට අවශ්‍ය මර්ධනයට අළුත් ක්‍රියාමාර්ගයක් ඇති කරගෙන තිබෙන බවයි පෙනෙන්නේ.

පසුගිය අවුරුද්ද තුළ පැහැරගැනීම් සිය ගණනක් සිදු වුණා. මෙයින් කිහිපයක් රජය විසින්ම කළ බවට සාක්ෂි ලැබුනා. හොඳ උදාහරණයක් තමයි මව්බිම මාධ්‍යවේදී පරමේශ්වරීගේ අත්අඩංගුවට ගැනීම. එය සුදු වෑන් එකකින් කළ පැහැරගැනීමක් ලෙස ඇරඹුනා. අන්තිමේදී එළි වුනේ ත්‍රස්ත විමර්ශන අත්අඩංගුවට ගැනීමක් හැටියටයි.

ඒත් අනෙක් පැහැර ගැනීම් රාජ්‍ය අනුග්‍රහය ඇති අතුරු හමුදාවලින් කළ බවට විවිධ සාක්ෂි මතු වුණා. රවිරාජ් මරණයත් එවැනි කණ්ඩායම් කළ බවටයි පිළිගැනීම.

අන්තිමේදී රජයම කියන්න පටන් ගත්තා ත්‍රස්තවාදය මැඩ පැවැත්වීමේදී සිවිල් සමාජය තුළ සැඟවී සිටින ත්‍රස්තවාදීන් අල්ලා ගැනීමට අනියම් ක්‍රියාපිළිවෙත් යෙදිය යුතු බව. ඇමරිකාව ඉරාකයේදී මෙවැනිම ක්‍රියාමාර්ග ගන්නා බවකුත් ප්‍රකාශ වුණා.

ඔයින් මෙයින් අතුරුදහන්වීම් හා අනියම් මරාදැමීම් ගැන රජයේ වගකීම ගැන ජාත්‍යන්තර මට්ටමෙනුත් කථා වෙන්නට පටන් ගත්තා.

එනිසාම ඇමරිකාව වගේ රටවල්වල ඇති වුණ ජනතා බලපෑම් නිසා යුධාධාර නැවැත්වීමටත් පියවර ගන්න තැනට බුෂ් පාලනය වුණත් තල්ලු වුණා. තවමත් ඒ තහංචි අඩු වෙලා නෑ. බුෂ් පාලනයට වුණත්, අනියම් ලෙස උදව් කළත් කෙළින් යුධ ආයුධ වියදම් දරන්න බෑ.

දැන් මේ දකුණේ මර්ධනය සඳහා අළුත් මාර්ගයන් හදාගෙන තියෙනව. රූපවාහිනියේ ඇති වුණ කළබැගෑනිය ඒ උඩයි. ජාතික රූපවාහිනියේ සේවක සටනේ ක්‍රියාකාරී වුණ යුඇන්පී, ජේවීපී යැයි සැක කරන මූලිකයින්ට විරුද්ධව මැර ප්‍රහාර එල්ල වුණා.

මේවා ඉතාම හොඳට සැලසුම් කළ මැර ප්‍රහාර වන අතරම ඒවායේ සුළමුල පොලීසියටත් හොයන්න බැරි වුණා. සාමාන්‍ය මැර ක්‍රියාවලදී හරියට සාක්ෂි හොයා ගන්න බැරි වුණත් වගකිව යුතු මැර නායකයින් හඳුනාගන්නට පොලීසියට පුළුවන්. මොකද? මැර ජාලයන් ගැන සෑහෙන තොරතුරු පොලීසියේ තිබෙන නිසා. ඒත් මේ සිද්ධි ගැන හොයන්න බැරි වුනේ ඉහළ දේශපාලන අතක් මැර ක්‍රියාවල පසුපස තිබුණ නිසයි.

මෙවර මාධ්‍යකරුවන්ට තර්ජන ආවේ අතුරු හමුදාවලින් නෙවෙයි. ජාතික රූපාවාහිනියේ පමණක් නොව ලක්බිම හා මව්බිම පත්‍ර වාර්තා කරුවන්ටත් පහර එල්ල කළේ මැර පිරිස් බවයි එළිවෙන්නේ.

එතකොට මැරයන් යෙදවීමේ අළුත් ක්‍රියාමාර්ගයක් මහින්ද අනුගමනය කරනවද යන ප්‍රශ්නය මතුවෙනව. ජනාධිපතිතුමා ඉදිරිපිට සාකච්ඡාවෙදීම මර්වින්ට මැර බලය යෙදීම නවතන ලෙස ජනාධිපති අණ කරපු වෙලාවේ දොහොත් මුදුනින් එය පිළිගෙන ඉටු කිරීමට මර්වින් එකඟ වෙලා.

ඒකෙන් පේනවා මැර ක්‍රියාමාර්ග දේශපාලන නායකයින්ගෙන් දියත් වුණ බව. මාධ්‍යවේදීන් බියවැද්දීමේදී අළුත් ක්‍රියාමාර්ගය ලෙස දියත් වුනේ මැර බලය යෙදීමයි. ඒත් පංති බලවේගයන් ඒකරාශී වීම උඩ එය ඉදිරියට ගෙන යන්නට බැරි වුණා. මැර බලය නිසා හැමෝම බිය වුණා නම් මේ ජයග්‍රහන ලැබෙන්නේ නෑ.

බිය නොවී සටන ගෙනයාම ගැන මාධ්‍ය සමිති නායකයින්ට තුති පුද කළ යුතුයි.